# FPA පුවත් සංග්‍රහය

2017 පළමු කලාපය

www.fpasrilanka.org

තිරසාර සංවර්ධන ඉලක්ක ජයගනිමු...


# තිරසාර සංවර්ධනයේදී කාන්තා සහ තරුණ දායකත්වය සඳහා යෝජනාවලියක් සකස් වේ.



ඡායාරූපයේ වමේ සිට : ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ නියෝජිත මාකස් රුක්, තිරසාර සංවර්ධන අමාත්‍යාංශයේ උපදේශක උචිත ද සොයිසා මහතා, නියෝජ්‍ය අමාත්‍ය සුමේධා පී. ජයසේන මහත්මිය, ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ විධායක අධ්‍යක්ෂිකා තුෂාරා රණසිංහ මහත්මිය පොල්තෙල් පහන දල්වමින්....



ගරු අමාත්‍ය ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා




විධායක අධ්‍යක්ෂිකා තුෂාරා රණසිංහ මහත්මිය

ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය, තිරසර සංවර්ධන සහ වනජීවී අමාත්‍යාංශය හා එක්ව තිරසර සංවර්ධනයේ දී කාන්තා සහ තරුණ දායකත්වය සඳහා යෝජනාවලියක් සකස් කරන ලදි.

දේශපාලනික, ආර්ථික, තරුණ, කාන්තා ආදි ක්ෂේත්‍ර ගණනාවක් නියෝජනය වන ආකාරයෙන් රාජ්‍ය, දේශීය හා ජාත්‍යන්තර සංවිධාන රැසක සියයකට වැඩි පිරිසක් සහභාගී වූ දෙදින වැඩමුළුවක් මගින් මෙම සැලැස්ම සකස්කිරීම පිළිබඳ කරුණු සංවාදයකට ලක්කරනු ලැබීය.

මෙහිදී සකස් කරන ලද ක්‍රමෝපායික සැලැස්ම නුදුරු අනාගතයේ දී රජයට බාරදීමට කටයුතු සකස්වෙමින් පවතී.

## ජනගහනය සහ සංවර්ධනය පිළිබඳ පාර්ලිමේන්තු කණ්ඩායම් වැඩමුළුවට ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය ද එක්වෙයි.



ජනගහනය හා සංවර්ධනය පිළිබඳ ශ්‍රී ලංකා පාර්ලිමේන්තු කණ්ඩායම් නායක ගරු අමාත්‍ය එස් . බී. දිසානායක මැතිතුමා ඇතුළු පිරිස

ජනගහනය සහ සංවර්ධනය පිළිබඳ පාර්ලිමේන්තු නියෝජිතයින්ගේ ආසියානු සම්මේලනය සහ ජනගහනය හා සංවර්ධනය පිළිබඳ ශ්‍රී ලංකා පාර්ලිමේන්තු කණ්ඩායම එක්ව මීගමුවේ දී පැවැති වැඩමුළුවේ දේශන දෙකක් සඳහා ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයට අවස්ථාව ලැබී තිබුණි. විධායක අධ්‍යක්ෂිකා තුෂාරා රණසිංහ මහත්මිය සහ ප්‍රතිපත්ති, මහජන සම්බන්ධතා සහ අධිවාචන ඒකකයේ අධ්‍යක්ෂිකා මදු දිසානායක මහත්මිය විසින් එම දේශන පවත්වන ලදි.

# කාර්ය මණ්ඩලය සඳහා සේවා සම්මාන

ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ දීර්ඝ කාලයක් සේවා කළ පිරිස සඳහා සම්මාන පිරිනැමීම සෑම වසරකම ජනවාරි පළමු වැනිදා සිදුකරනු ලබයි.

## 2017 වසරේ සම්මානලාභීන්

### වසර 30 ක සේවා කාලය සඳහා



රවීන්ද්‍ර පීරිස් මහතා ගරු සභාපති චන්දිම ගුණවර්ධන මහතා අතින් තිලිණ ලබා ගත් මොහොත.

### වසර 10 ක සේවා කාලය සඳහා



සුහයිල් ජුනයිඩ් මහතා හිටපු ගරු ලේකම් ලාල් හේවාපතිරණ මහතා අතින් තිලිණ ලබා ගත් මොහොත.



ඩී. එල්. රෝහණ මහතා හිටපු ජාතික මණ්ඩල සමාජිකා චන්ද්‍රකාන්ති ධර්මදාස මෙනවිය අතින් තිලිණ ලබා ගත් මොහොත.

### වසර 25 ක සේවා කාලය සඳහා



තමරා මන්ත්‍රීරත්න මෙනවිය ගරු ලේකම් වෛද්‍ය එස්ටර් අමරසේකර මහත්මිය අතින් තිලිණ ලබා ගත් මොහොත.



ඩී. එච්. පාලිත මහතා ගරු හිටපු සභාපති ශිරන්ති ද සිල්වා මහත්මිය අතින් තිලිණ ලබා ගත් මොහොත.



හද්‍රා උඩවත්ත මහත්මිය හිටපු ගරු සභාපති පද්මා කුමාරණතුංග මහත්මිය අතින් තිලිණ ලබා ගත් මොහොත.

### වසර 15 ක සේවා කාලය සඳහා



ගුරුසාමි කන්නම්මා මහත්මිය මූල්‍ය කමිටුවේ ගරු සභාපති කාමිල් මොහොමඩ් මහතා අතින් තිලිණ ලබා ගත් මොහොත.

### දකුණු ආසියා කලාපීය සමුළුවට එක්වෙමින්......



*ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ ගරු සභාපති චන්දිම ගුණවර්ධන මහතා (වම් කෙළවර ) සැලසුම් කළ මා පිය භාවය පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනයේ දකුණු ආසියානු කලාපීය සමුළුවට එක් වූ අවස්ථාව.*

# කාන්තාවන්ට එරෙහි හිංසනය වළක්වාලමු

## කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස් ලෙස සැලකීම් ඉවත් කිමේ සම්මුතිය (CEDAW)

1979 දී එක්සත් ජාතීන්ගේ සම්මේලනයේදී සම්මත කර ගන්නා ලද කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස් ලෙස සැලකීම් ඉවත් කිරීමේ සම්මුතිය (CEDAW - The Convention on the Elimination of all forms of Discrimination against Women) කාන්තාවන්ගේ හිමිකම් පිළිබඳ ජාත්‍යන්තර පනත ලෙස බොහෝ විට හැඳින්වේ. පූර්විකාවකින් සහ කොන්දේසි 30කින් සමන්විත වන මෙම සම්මුතිය මගින් කාන්තාවන්ට එරෙහි වෙනස් ලෙස සැලකීම් යනුවෙන් නියමකර ඇති කරුණු විස්තර කර ඇති අතර එවැනි වෙනස් ලෙස සැලකීම් අවසන් කිරීම සඳහා වන ජාතික ක්‍රියාකාරී වැඩසටහනක්ද දක්වා ඇත.

## ලිංගික සහ ප්‍රජනක සෞඛ්‍ය හිමිකම් (SRHR) හා සම්බන්ධ සටහන්

ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් වූ හිංසනය කෙරෙහි යොමු වූ ප්‍රතිපත්ති රාමුව සහ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2016-2020) 2016 දී සම්මත කර ගැනීම වැනි කාන්තාවන්ට එරෙහි වෙනස් ලෙස සැලකීම් ඉවත් කිරීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව ප්‍රවර්ධනය කඩිනම් කිරීම කෙරෙහි යොමු වූ සිය ආයතනික ප්‍රතිපත්ති රාමුව වැඩිදියුණු කිරීමේ රාජ්‍ය පාර්ශවයේ ප්‍රයත්නයන් කමිටුව විසින් අගය කරනු ලැබේ.

කාන්තාවන්ට එරෙහි වෙනස් ලෙස සැලකීම් තහනම් කිරීමේ නෛතික රාමුව ගැන සැලකීමේදී....

**• ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හඳුනා ගැනීම වෙනස් ලෙස සැලකීම තහනම් වන හේතුවක් වන්නේය යන ව්‍යවස්ථා සභාවේ මූලික අයිතිවාසිකම් පිළිබඳ අනු කමිටුව විසින් කරන ලද යෝජනාව කෙරෙහි යථා අවධානය රාජ්‍ය පාර්ශවය විසින් යොමුකළ යුතු බවට කමිටුව නිර්දේශ කර සිටී.**

• රාජ්‍ය පාර්ශවය විසින් විවාහක ස්ත්‍රී දූෂණය අපරාධයක් ලෙස පිළිගැනීම සහ වධහිංසාව පිළිබඳ පනතේ වධහිංසාව අර්ථ දැක්වීමේදී බරපතල ලිංගික හිංසනයන් ද ඇතුලත්වන පරිදි කටයුතු කිරීම;

• අධිකරණය විසින් නියම කෙරෙන ආරක්ෂණ විධිවිධානයන් අදාල පාර්ශවයන් වෙත වහාම ලබාදීම සහ ඵලදයක ලෙස බලාත්මක කිරීම තහවුරු කෙරෙන පරිදි ගෘහස්ථ හිංසනය වැළැක්වීමේ පනත සංශෝධනය කිරීම සහ, අධිකරණයේ නඩු විභාගයක් සිදුකිරීමට පෙර බේරුම් කිරීමක් සඳහා සහභාගීවීමේ අවශ්‍යතාවයන් ඉවත් කිරීම;

• රැකියා සම්බන්ධයෙන්, රාජ්‍ය සහ පුද්ගලික අංශ වල ලිංගික හිංසනයන් පිළිබඳ ගොනු නොවූ දත්තයන් රැස්කළ යුතු යැයි කමිටුව නිර්දේශ කර සිටී.

• අධ්‍යාපනය ලැබීමේ අනිවාර්ය වයස 14 සිට 16 දක්වා වැඩි කිරීම සහ වයසට සරිලන විස්තීරණ ලිංගික අධ්‍යාපනයක් රාජ්‍ය පාර්ශවය විසින් ආයතනගත කළ යුතු යැයි, එය නිර්දේශ කර සිටී.

• ලිංගික හිංසනය හා සම්බන්ධ නඩු විභාගයන් කඩිනම් කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ විශේෂ ඒකකයක් පිහිටුවීම සහ, කාන්තාවන්ට එරෙහි හිංසනයන් සඳහා අත්සිට වූ සිර දඬුවම් ලබාදීම තහනම් කෙරෙන සහ අවම අනිවාර්ය සිර දඬුවමක් නියම කෙරෙන පරිදි නීති හඳුන්වා දීම;

• ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් වූ හිංසනය කෙරෙහි යොමුකළ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම, කාන්තාවන්ට එරෙහිව සිදුවන ඒකාකාර වූ වෙනස් ලෙස සැලකීම් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් වූ හිංසනයන් කෙරෙහි ජනතාව දැනුවත් කිරීමේ ප්‍රයත්නයන් පුළුල් කිරීම; ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් වූ කාන්තාවන්ට එරෙහිව සිදුවන සියලු ආකාරයේ හිංසනයන් පිළිබඳ දත්තයන් ක්‍රමවත්ව රැස්කිරීම සහ විශ්ලේෂණය කිරීමත කමිටුව විසින් නිර්දේශ කර සිටී.

• ගැටුම් හා සම්බන්ධ කාන්තාවන්ට එරෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ හිංසනයන් වලදී හමුදාව සහ පොලීසිය විසින් සිදුකරන ලද ලිංගික හිංසනයන් සම්බන්ධයෙන් රජයේ පාර්ශවය කිසිදු ලිහිල් කිරීමකින් තොරව ක්‍රියාත්මක විය යුතු බව කමිටුව නිර්දේශ කර සිටී.

• ගණිකා වෘත්තිය හා සම්බන්ධ උපයෝජනයන් හා ජාවාරම් සම්බන්ධයෙන් අයාල ආඥා පනත අවලංගු කරන මෙන් කමිටුව නිර්දේශ කර සිටී.

• කාන්තාවන්ගේ ඉහළ සාක්ෂරතාව සහ ප්‍රාථමික මට්ටමේදී බාලකයින් සහ බාලිකාවන් බොහෝ දුරට සමාන වන පරිදි බඳවා ගැනීම් සම්බන්ධයෙන් කමිටුව ප්‍රසාදය පළකර සිටින අතර, ලිංගික අල්ලස හා සම්බන්ධ වැරදි ඇතුලත් වන ලෙස අල්ලස් පනත සංශෝධනය කරන ලෙස ද, කමිටුව නිර්දේශ කර සිටී.

### සෞඛ්‍ය කොන්දේසි හා සම්බන්ධව

• ගබ්සා කිරීම නීත්‍යානුකූල කිරීමටත්, ආරක්ෂා සහිත ගබ්සා කිරීමේ සේවාවන් ලබාගැනීමට ඇති බාධාවන් ඉවත් කිරීමටත්, ගැටුම් වලින් පීඩාවට පත් ප්‍රදේශවල සහ වතුකරයේ කාන්තාවන්ගේ සෞඛ්‍ය අවශ්‍යතාවන් සඳහා ප්‍රමාණවත් අරමුදල් වෙන් කිරීම් තහවුරු කිරීමටත්, සියලූම කාන්තාවන්ට සහ බාලිකාවන්ට ලිංගිකතාව පිළිබඳ තොරතුරු වෙත ප්‍රවේශ වීමේ හැකියාව තහවුරු කිරීමත් සඳහා අවශ්‍ය නීතිමය සංශෝධන සිදුකරන ලෙස කමිටුව නිර්දේශ කර සිටී.

### විවාහය සහ පවුල් සබඳතාවයන් හා සම්බන්ධ වෙනස් කොට සැලකීමේ නීති හා සම්බන්ධව,

• මුස්ලිම් කාන්තාවන්ට මුස්ලිම් පෞද්ගලික නීතියෙන් බැහැරවීම සඳහා සහ නිදහසේ තීරණ ගැනීමේ හැකියාව ලැබෙන පරිදි පොදු විවාහ ලියාපදිංචි කිරීමේ නීතිය සංශෝධනය කිරීම .

• කාන්තාවන් සඳහා විවාහ වීමේ අවම වයස අවුරුදු 18 දක්වා වැඩි කිරීමත සහ ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණ අපරාධය කිසිදු බැහැර කිරීමකින් තොරව වයස අවුරුදු 16ත් පහළ සියලුම බාලිකාවන්ට බලපාන පරිදි අපරාධ නීති සංග්‍රහයේ 363 වන වගන්තිය සංශෝධනය කිරීමට ද රාජ්‍ය පාර්ශවය කටයුතු කළ යුතු බවට කමිටුව නිර්දේශ කර සිටී.



## සංවිධානයේ කටයුතු ජාත්‍යන්තර අධීක්ෂණයට

ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය වෙත සැලසුම් කළ මා පිය භාවය පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනයේ නිලලත් සාමාජිකත්වය පිරිනැමීමට කෙරෙන අධීක්ෂණ කටයුතු සඳහා ශ්‍රී ලංකාවට පැමිණි එම සම්මේලනයේ අධීක්ෂණ කණ්ඩායම ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ ජාතික මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ ඡායාරූපයකට පෙනී සිටි අවස්ථාව.

## ජාත්‍යන්තර කාන්තා දින ජාතික සමුළුව අමතමින් ...








2017 ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් මාතර දී පැවති ජාතික සමුළුවේදී 'කාලය, කාන්තාව, කාල හිඟය ' තේමාව යටතේ ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ ප්‍රතිපත්ති, මහජන සම්බන්ධතා සහ අධිවාචන ඒකකයේ අධ්‍යක්ෂිකා මදු දිසානායක මහත්මිය විසින් විශේෂ දේශනය කළ අවස්ථාව.

## ගෝලීය අරමුදලේ දකුණු ආසියානු කලාපීය HIV ව්‍යාපෘතිය



නව වසරේ සැලසුම් සකස් කිරීම සඳහා නේපාලයේ කත්මන්ඩු නුවරදී පැවති වැඩමුළුවට ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය) සමන් පෙරේරා මහතා, සහකාර අධ්‍යක්ෂ (ඇගයීම් හා නියාමන) දුමින්ද රාජකරුණා මහතා සහ ව්‍යාපෘති සම්බන්ධිකාරිනි දෙව්මි දම්පැල්ල මෙනවිය සහභාගී වූ අවස්ථාව.



කළුතර දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් සඳහා පැවති වැඩමුළුවක අවස්ථාව. නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම අවස්ථාවට ජාතික ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන වැඩසටහනේ විශේෂඥ වෛද්‍ය ජානකී විදානපතිරණ මහත්මියද සහභාගි විය.

# FPA පුවත් සංග්‍රහය

2017 පළමු කලාපය

www.fpasrilanka.org

තිරසාර සංවර්ධන ඉලක්ක ජයගනිමු...


ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ තොරතුරු, වෛද්‍ය උපදෙස් හෝ උපදේශන සේවා ඔබ ඉන්නා තැන සිටම ලබාගැනීමට
අමතන්න 2 588 488
පිවිසෙන්න www.happylife.lk
SMS කරන්න 071 6 408 408


37/27, බුලර්ස් පටුමග, කොළඹ 07. දුරකථන : 011 2 555 455
ෆැක්ස් : 011 2 55 66 11 ඊ මේල් : fpa@fpasrilanka.org


## දරුවන් වෙනුවෙන් ම

වගකීම ඉටු කරමු
නිසි මඟ පෙන්වමු

දැනගනිමු ජය ගනිමු! ඔබේ ලිංගික සෞඛ්‍ය අයිතීන් වෙනුවෙන්



"ශාරීරික සෞඛ්‍යය වගේම ලිංගික සෞඛ්‍යයත් මානව හිමිකම් වලින් ප්‍රධාන අංගයක් වෙනවා. ඒ පිළිබඳ අපේ රටේ ජනතාව විශේෂයෙන් තරුණ පරපුර දැනුවත් කිරීම වැදගත් වෙනවා."

විදේශ කටයුතු පිළිබඳ ගරු
රාජ්‍ය අමාත්‍ය
*වසන්ත සේනානායක*



"අපේ දරුවන්ට ලිංගිකත්වය පිළිබඳ හොඳ අධ්‍යාපනයක් නොලැබුණොත් ඔවුන්ගේ අනාගතය කවර හෝ අවස්ථාවක අඳුරුවන්නට පුළුවන්. එනිසා ලිංගික අධ්‍යාපනය ගෙදරින්ම ආරම්භ කළ යුතුයි. එම අධ්‍යාපනයත් කුසලතා සංවර්ධනයත් ලබාදීම අප සියලු දෙනාගේම වගකීමයි."

ප්‍රජා සෞඛ්‍ය විශේෂඥ වෛද්‍ය
*හරිස්චන්ද්‍ර යකන්දාවල*
වෛද්‍ය අධ්‍යක්ෂක
ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය



"පාසල් අධ්‍යාපනය ලබන සිසු සිසුවියන්ට ලිංගිකත්වය සම්බන්ධ කුතුහලයක් ඇත. එයට හේතුව ඒ පිළිබඳ අවශ්‍ය දැනුම, සත්‍ය තොරතුරු නොලැබීමයි. වැරදි තොරතුරු ලබා ගැනීමෙන් විවිධ ප්‍රශ්න ඇතිවෙන්න පුළුවන්. යම් සීමාවන්ට යටත්ව පාසල් වයසේ සිටම ලිංගික අධ්‍යාපනය ලබාදීම වඩාත් ඵලදායී බව මගේ විශ්වාසයයි."

*අජිත් රෝහණ*
නියෝජ්‍ය පොලිස්පති / නීති
පොලිස් මූලස්ථානය

## පරිපූර්ණ ලිංගික අධ්‍යාපනයක විද්‍යාත්මක ප්‍රවේශය පාසලට

### පරිපූර්ණ ලිංගික අධ්‍යාපනයක් සඳහා තරුණ පිරිස් දැනුවත් කිරීමට වැඩසටහන්......

මේ යටතේ දිවයින පුරා තරුණ තරුණියන් සඳහා ලිංගික අධ්‍යාපනයේ මූලිකාංග පිළිබඳ දැනුවත් කිරීම ඉලක්ක කරගත් වැඩසටහන් මාලාවක් ආරම්භකර තිබේ.



නාවලපිටිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ දී තරුණ තරුණියන් පිරිසක් සඳහා පැවති වැඩමුළුවක අවස්ථාව. *ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ කළමනාකාර මහේෂ් කුමාර මහතා වැඩමුළුව මෙහෙයවමින්...*


VISION2020
Sexual and reproductive health rights for all

සංස්කරණය : ආනන්ද බෝධිනායක - ananda@fpasrilaka.org
සම්බන්ධීකරණය : ප්‍රතිපත්ති, මහජන සම්බන්ධතා සහ අධිවාචන (Advocacy) ඒකකය

# අලෙවිකරණ විශිෂ්ටයින්ට සම්මාන



*2015 වසරේ ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ විශිෂ්ටතම අලෙවි නිලධාරියාට හිමි සම්මානය අලෙවි විධායක එස්. එන්. එම්. ජිබ්රි මහතා විසින් ලබාගත් මොහොත. විධායක අධක්ෂිකා තුෂාරා රණසිංහ මහත්මිය, ගරු සභාපති චන්දිම ගුණවර්ධන, අලෙවි තාක්ෂණික කමිටුවේ ගරු සභාපති චතුර චින්තක ජයසිංහ මහතා, අලෙවි ඒකකයේ අධ්‍යක්ෂ සුහයිල් ජුනයිඩ් මහතා ඡායාරූපයේ වෙති.*



*2 වන ස්ථානය - අලෙවි විධායක ලහිරු සමන් කුලසිංහ මහතා ගරු උප සභාපතිනි වෛද්‍ය ප්‍රාමිලා සේනානායක මහත්මිය*
*අතින් තිලිණ ලබා ගත් මොහොත*



*3 වන ස්ථානය - ප්‍රාදේශීය සහකාර අලෙවි කළමනාකාර තුෂාර බටදුවආරච්චි මහතා ගරු භාණ්ඩාගාරික එරල් ස්මිත් මහතා*
*අතින් තිලිණ ලබා ගත් මොහොත*

# ක්ෂේත්‍ර වැඩසටහන් ඒකකය - ජංගම වෛද්‍ය සායන

ශරීර ස්කන්ධ දර්ශකය (BMI), රුධිර පරීක්ෂාවන්, කාන්තාවන් සඳහා වූ පැප්ස්මියර් පරීක්ෂාව, පියයුරු පිළිකා හඳුනාගැනීම සඳහා පියයුරු පරීක්ෂාව, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනයන් පිටු දැකීම සඳහා වූ උපදේශන සේවා, මෙම ජංගම සායන තුළදී ජනතාවට ලබා ගැනීමට පහසුකම් සලසා තිබේ. මඩකළපුව FPA සුව සේවා මධ්‍යස්ථානය සංවිධානය කළ වෛද්‍ය සායන අවස්ථා කිහිපයක්.

*මඩකළපුව FPA සුව සේවා මධ්‍යාස්ථානයේ කළමනාකරු එස්.එච්. ඉම්තියාස් මහතා වැඩසටහනක් ආරම්භ කරමින්...*







